# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2128/9 - 2019 ජුනි මස 18 වැනි අඟහරුවාදා - 2019.06.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 24/51(v)

**(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත**

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 164 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 237 වන වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍ය.

2019 ජුනි මස 17 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

2015 නොවැම්බර් මස 12 වන දිනැති අංක 1940/21 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, 2015 අංක 02 දරන මෝටර් වාහන (සලකුණු, සංඥා, සංකේත හා මාර්ග ලකුණු කිරීම්) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඉහත නියෝගවල 13 වන නියෝගයේ (8) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :-


"(8) බස් රථ සඳහා වන නැවතුම් ස්ථානයක් සඳහන් කරනු ලබන ඕ. එස්. ඩී -06 සලකුණ යම් මාර්ගයක තබා ඇති විට, 19 වන නියෝගයෙහි (10) වන ඡේදයට හා 32 වන නියෝගයෙහි (3) වන ඡේදයට අනුකූලව නතර කිරීම සඳහා නියම කර ඇති වාහන හැර කිසිදු වාහනයක් එම සලකුණේ සිට මීටර් තිහක් (30) ඇතුළත නතර කිරීම හෝ නවතා තැබීම සිදු නොකළ යුතු ය. තව ද ඉහත සඳහන් මීටර් තිහක (30) දුර, මෙම මාර්ග ලකුණු කිරීම තත්කාලයේ පෙනෙන්නට තිබෙන විට මාර්ග ලකුණු කිරීම් ආර්එම් - 27 සිට මාර්ග ලකුණු කිරීම් ආර්එම් - 32 දක්වා ආසන්නතම ලක්ෂ්‍යයේ සිට ගණන් ගත යුතු ය.

(9) දුර ගමන් සේවා බස්රථ සඳහා වන සීමිත නැවතුම් ස්ථානයක් හා බස් රථ සඳහා වන නැවතුම් ස්ථානයක් සඳහන් කරනු ලබන ඕ. එස්. ඩී-26 සලකුණ යම් මාර්ගයක තබා ඇති විට 19 වන නියෝගයෙහි (10) වන ඡේදයට හා 32 වන නියෝගයෙහි (3) වන ඡේදයට අනුකූලව නතර කිරීම සඳහා නියමකර ඇති වාහන හැර


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කිසිදු වාහනයක් එම සලකුණේ සිට මීටර් තිහක් (30) ඇතුළත නතර කිරීම හෝ නවතා තැබීම සිදු නොකළ යුතු ය. තව ද, ඉහත සඳහන් මීටර් තිහක (30) දුර, මෙම මාර්ග ලකුණු කිරීම තත්කාලයේ පෙනෙන්නට තිබෙන විට මාර්ග ලකුණු කිරීම් ආර්එම්-27 සිට මාර්ග ලකුණු කිරීම් ආර්එම්-32 දක්වා ආසන්නතම ලක්ෂ්‍යයේ සිට ගණන් ගත යුතු ය.”

(2) ඉහත නියෝගවල III වන උපලේඛනයේ ඕ. එස්. ඩී-25 සලකුණට ඉක්බිතිවම පහත සලකුණ එකතු කිරීමෙන් :-

| | | | |
|---|---|---|---|
| ඕ. එස්. ඩී - 26 | දුර ගමන් සේවා බස්රථ සීමිත නැවතුම හා බස්රථ නැවතුම |  | ඕ. එස්. ඩී - 06 සළකුණ මගින් ප්‍රකාශිත බස්රථ නැවතුමක් ද ඇතුළුව දුර ගමන් සේවා බස්රථ සඳහා වන සීමිත නැවතුමක් පිහිටි ස්ථානයක් පෙන්නුම් කිරීම සඳහා |

07 - 34

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.